# පළාත් සභා මැතිවරණ ක්‍රමය පිළිබඳ සිවිල් සමාජ ක්‍රියාකාරී කමිටුවේ සමාලෝචන වාර්තාව

2018 අගෝස්තු 01

CMEV

PAFFREL

# පළාත්සභා මැතිවරණ ක්‍රමය පිළිබඳ සිවිල් සමාජ ක්‍රියාකාරී කමිටුවේ සමාලෝචන වාර්තාව

2018 අගෝස්තු මස 1 වන දින

පසුගිය පෙබරවාරි මස 10 වැනි දින පැවැත්වූ පළාත් පාලන ඡන්ද විමසීම සඳහා පළමු වරට යොදාගත් "මිශ්‍ර සහික සමානුපාතික නියෝජන මැතිවරණ ක්‍රමය" මගින් ඉන් පෙර ක්‍රියාත්මක වූ "විවෘත ලැයිස්තු සමානුපාතික නියෝජන මැතිවරණ ක්‍රමය" යටතේ දක්නට ලැබුණු ප්‍රධාන අඩුලුහුඩුකම් තුනක් මඟහරවා ගැනීමට හැකිවිය. එනම්:

1. මැතිවරණ ප්‍රචාරණ කටයුතු අතරතුර පෙරදී දක්නට ලැබුණු මනාප පොරය ට නැවතීමේ තිත තැබීම (නිද: මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය අතරතුර දේශපාලන පක්ෂ තුළ හට ගන්නා තරඟකාරීත්වය අවම වීම)
2. තම පාක්ෂිකයන් වෙත වගවීමක් සහිත නියෝජිතයන් හට තෝරා පත්වීමට අවස්ථාවක් හිමි වීම
3. මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය සඳහා අපේක්ෂකයන් හට වැය වන අධික පිරිවැය අවම වීම

ඊට අමතරව මෙම නව ක්‍රමය හේතුවෙන් මැතිවරණ ආශ්‍රිත බරපතල ප්‍රචණ්ඩක්‍රියා අවමවූ අතර, නරක් වූ ඡන්ද[1] ප්‍රතිශතය අවම වීමටද එය හේතු විය, කේවල අසුන් සඳහා තරඟ වදින අපේක්ෂකයින්ගේ[2] අභිමතාර්ථයන් මුදුන්පත් කිරීම වෙනුවට දේශපාලන පක්ෂ මට්ටමින් අභිමතාර්ථයන් නියෝජනයට ද අවකාශ සැළසිනි. එමෙන්ම ඉතා වෙහෙසකර කාර්යයක් වන ඡන්ද ගණන් කිරීම ද වඩාත් සරලව හා ඉක්මනින් මෙන්ම පහසුවෙන් සිදුකිරීමට හැකියාව ලැබිණි.
වර්ෂ 2018 පෙබරවාරි මස පැවැත් වූ ඡන්ද විමසීමෙන් පසුව මෙම මැතිවරණ ක්‍රමය පිළිබඳ නොයෙක් පාර්ශව වලින් විවේචන එල්ලවූ අතර, ඒවායින් බොහොමයක් මෙම ක්‍රමවේදය නිසි අයුරින් වටහා නොගැනීම නිසාත්, ශ්‍රී ලාංකේය දේශපාලන සංස්කෘතිය තුළ ඉතා ගැඹුරින් කිඳාබැස ඇති ව්‍යුහාත්මක ගැටළු හා වත්මන් දේශපාලන පරිසරයේ බලපවත්නා ගැටළු ද, මැතිවරණ ක්‍රමය තුළ නිරායාසයෙන් විද්‍යමාන වන වහා සකසා ගත යුතුව ඇති විවිධ අඩුපාඩු නිසා ද එල්ල වූ ඒවා ය.
වඩා යහපත සළසනු වස් තේරීපත්ව ඇති මහජන නියෝජිතයන් හට සහාය වීමේ අභිමතාර්ථයෙන් යුත් සිවිල් සමාජ සාමූහිකයක් ලෙස අප ඉතා ගෞරව පූර්වකව පාර්ලිමේන්තුව විසින් සිදුකළ යුතුව ඇතැයි අදහස් කරනු ලබන කරුණු කිහිපයක් මෙලෙසින් සටහන් කරනු ලැබේ.

- මිශ්‍ර සහික සමානුපාතික නියෝජන ක්‍රමය පිළිබඳ පවත්නා දුර්මත වහා දුරුකිරීම
- යෝග්‍ය නීතිමය ක්‍රමවේදයක් මගින් බලපවත්නා සැබෑ ගැටළුවට විසඳුම් ලබාදීම , සහ
- නියමිත කාල සීමාව ඉක්ම ගොස් ඇති පළාත් සභාවන්හි ඡන්ද විමසීම් කිසිදු ප්‍රමාදයකින් තොරව පැවැත්වීමට කටයුතු කිරීම

නව පළාත් සභා මැතිවරණ ක්‍රමයේ[3] පවතින ගැටළු සඳහා නිසි විසඳුම් ලබාදීම අරමුණු කොට ගෙන අප විසින් සම්පාදිත නිර්දේශයන් වගු අංක 1හි සාරාංශ ගතකොට තිබේ. සමාලෝචන කමිටුවේ සංයුතිය සහ සාකච්ඡා මාලාව පිළිබඳ සාරාංශගත විස්තරයක් උපග්‍රන්ථ 1 හි අන්තර්ගත වේ. නිර්දේශ සඳහා පාදක වූ තර්කානුකූල පසුබිම උපග්‍රන්ථ 2හි සාරාංශගත කොට ඇත. දුර්මත දුරු කිරීමේ අරමුණින් සම්පාදිත "නිරතුරුව අසනු ලබන ප්‍රශ්න (FAQs)" ඇතුළත් ලැයිස්තුවක් උපග්‍රනථ තුනෙහි අඩංගුකොට ඇත.

---

[1] පළාත් පාලන ඡන්ද විමසීමේ දී 2011 දී පවත්වන ලද ඡන්ද විමසීමේ දී ලද ඡන්ද සංඛ්‍යාවෙන් 4.52% ක් ප්‍රතික්ෂේප වූ අතර 2018 වසරේ පැවති පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී එය 1.67% ක් විය. 2018 දී දළ ඡන්ද පත්‍රිකා හඳුන්වාදීම හේතුවෙන් මෙම ප්‍රතික්ෂේපිත ඡන්ද ප්‍රතිශතය සැළකිය යුතු ලෙස අඩු කිරීමකි.

[2] දේශපාලන පක්ෂ තුළ තරඟතාරීත්වය උද්ගත කර වූ විවෘත ලැයිස්තු සමානුපාතික නියෝජන ක්‍රමයට එරෙහිව සාමූහික උද්ඝෝෂනය කිරීමට අපේක්ෂකයන් පෙළඹ වූයේය.

[3] 2017 අංක 17 දරණ පළාත් සභා මැතිවරණ (සංශෝධන) පනත මගින් හඳුන්වා දුන් පරිදි

**1 වන වගුව**

| **ගැටලුව** | **නිර්දේශ** |
|---|---|
| 1.නව මැතිවරණ ක්‍රමය පිළිබඳ පවත්නා දුර්මත | මෙම වාර්තාවේ අන්තර්ගත "නිරතුරුව අසනු ලබන ප්‍රශ්න (FAQs)" පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන්, පළාත් පාලන ආයතන සභිකයන් සහ පොදු ජනතාව අතර මාධ්‍ය උපයෝගී කරගනිමින් බෙදාහැරීම |
| 2.සීමා නිර්ණය හා සබැඳි සීමාවන් පිළිබඳ පවත්නා ප්‍රතිවිරෝධතා | සීමා නිර්ණය ක්‍රියාවලිය හා සබැඳිව රජය මෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් අනුගමනය කළ යුතු ක්‍රියාවලිය පිළිබඳ කරුණු පළාත්සභා මැතිවරණ (සංශෝධන) පනතේ 3 අ වගන්තියෙහි දක්වා ඇත. |
| 3.පළාත් සභාවල ක්‍රියාකාරී බහුතරයක් නිර්මාණය කරගැනීමට දේශපාලන පක්ෂවලට ඇති නොහැකියාව. | මන්ත්‍රීවරුන්සියයකට (100) වඩාඅඩුනියෝජනයක් සහිත පළාත් සභාවන්හි, වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගන්නා ලද දේශපාලන පක්ෂ වෙත ප්‍රසාද මන්ත්‍රී ධුර හතරක් (4) ක් පිරිනැමීම.<br><br>මන්ත්‍රීවරුන් සියයකට (100) වඩාවැඩි නියෝජනයක් සහිත පළාත් සභාවන්හි, වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගන්නා ලද දේශපාලන පක්ෂය වෙත ප්‍රසාද මන්ත්‍රී ධුර පහක් (5) ක් පිරිනැමීම[4]. |
| 4. යටත් පිරිසෙන් මන්ත්‍රීවරුන්ගෙන් 50% ක ප්‍රමාණයක් දිස්ත්‍රික්ක ලැයිස්තු යටතේ තෝරාපත් කර ගනු ලබන අතර,ඔවුන් අතරින් ඉතා සුළු ඡන්ද ප්‍රමාණයක පරතරයක් යටතේ තම අසුන ජයගැනීමට අපොහොසත් වන අපේක්ෂකයන් එතුළින් බලවත් අසතුටට පත්වීම. | තෝරාපත්කර ගැනීමේ ක්‍රමවේදය සඳහා දේශපාලන පක්ෂ මගින් ඉදිරිපත් කරනු ලබන ලැයිස්තු වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී මෙන්ම ජනතාවාදී ක්‍රියාවලියක් බවට පත්කිරීම.<br><br>දිස්ත්‍රික්ක ලැයිස්තු ප්‍රමුඛතාගත අනුපිළිවෙලක් යටතේ සකස් කිරීම, එනමුත් දේශපාලන පක්ෂ වෙත දිස්ත්‍රික්කය සඳහා ලැබිය යුතුව පවත්නා මන්ත්‍රීධුර සංඛ්‍යාව අතරින් 1/3 ක ප්‍රමාණයක මන්ත්‍රීධුර සංඛ්‍යාවක් කේවල ආසන ජයගැනීමට නොහැකි වන්නා වූ අපේක්ෂකයන් වෙත ලබා දීම සඳහා ඉඩ ප්‍රස්ථාව ලබාදීම. |
| 5.ජයග්‍රාහී දේශපාලන පක්ෂය බොහෝ විට දිස්ත්‍රික් ලැයිස්තුව යටතේ පිරිනැමෙන ආසන නොලබන බැවින්, එම ලැයිස්තුව යටතේ තෝරාපත් කරගනු ඇතැයි අපේක්ෂාවෙන් ඉතා වෙහෙස කර මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයක නියැළුණු අපේක්ෂකයන් කළකිරීමට පත්වීම. | ඉහත අංක 3ට අදාළ නිර්දේශයෙහි සඳහන් පරිදි ප්‍රසාද ආසන සඳහා දිස්ත්‍රික්ක ලැයිස්තුව යටතේ හෝ කේවල ක්‍රමය යටතේ ආසන ජයගැනීමට අසමත් වූ අපේක්ෂකයන් නම් කිරීම සඳහා අදාළ දේශපාලන පක්ෂයේ ලේකම්වරයා වෙත යම් නම්‍යශීලීත්වයකින් කටයුතු කිරීමට අවකාශ සැළසීම. |
| 6. කාන්තා නියෝජනය | තරග කිරීමට කාන්තාවන් හට වැඩි අවකාශයක් සැළසීම උදෙසා දැනට කේවල ආසන සඳහා තරග කිරීම වෙනුවෙන් අදාළ ලැයිස්තුව තුළින් |

[4]2 වන උපග්‍රන්ථයෙහි 3න් වන කොටස බලන්න

| | |
|---|---|
| | පිරිනමා ඇති හයෙන් එකක් (1/6) වන කාන්තා අපේක්ෂක සංඛ්‍යාව පහෙන් එකක් (1/5) දක්වා වැඩි කිරීමට කටයුතු කිරීම.<br><br>පූර්ව ශ්‍රේණිගත කළ දිස්ත්‍රික්ක ලැයිස්තුව, කාන්තා සහ පිරිමි අපේක්ෂකයන්ගේ එක් එක් නම්වලට විකල්පමය ලෙස (වරකට කාන්තා අපේක්ෂිකාවක් හා තවත් වරකට පිරිමි අපේක්ෂකයෙක් වශයෙන්) සංවෘතව තැබීම. එකී ලැයිස්තුව ආරම්භවිය යුත්තේ කාන්තාවකගේ නමිනි.<br><br>පෙර පැවති මනාප ක්‍රමය යළිත් භාවිත කිරීමට පාර්ලිමේන්තුව තීරණය කළහොත්, කාන්තාවන් සඳහා 25% ක නාම යෝජනා අවස්ථාවක් සැළසීමට අදාළව අනිවාර්ය ප්‍රතිපාදනයක් අන්තර්ගත කිරීම කාලෝචිත හා තීරණාත්මක ය[5]. |

[5]දැනට පවතින පළාත් සභාවන්හී කාන්තා නියෝජනය 4%ටත් වඩා අඩු ප්‍රමාණයකින් යුක්ත වන බැවින් එම ගැටලුව නිරාකරණය කිරීම සඳහා මෙම නිර්දේශය ඉදිරිපත් කොට තිබේ

## උප ග්‍රන්ථය 1

## කමිටුවේ සංයුතිය හා උපදේශක ක්‍රියාවලිය

පළාත් පාලන මැතිවරණ ක්‍රමය ම සඳහා උපයෝගී කරගන්නා ලද මැතිවරණ ක්‍රමය ම, පළාත් සභා සඳහා ද උපයෝගී කරගැනීමට තීරණය කිරීමත් සමඟ, ඒ පිළිබඳ එතෙක් පැවති සමාජ කථිකාව වඩාත් උණුසුම් එකක් බවට පරිවර්තනය විය. සමහර ප්‍රධාන දේශපාලන පක්ෂ, මැතිවරණ කොමිෂන් සභාව, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මෙන්ම වෙනත් අදාළ පාර්ශවයන්ගේ අදහස වූයේ නව මැතිවරණ ක්‍රමය පිළිබඳ (වසර 2017 අංක 17 දරන පළාත් සභා මැතිවරණ (සංශෝධන) පනත) . අදාළ පාර්ශව ද එක් කර ගනිමින් පුළුල් ජනතා සංවාදයක් පැවැත්වීම සඳහා මෙරටේ මැතිවරණ නිරීක්ෂණ සංවිධාන (පැෆ්රල් සහ සී.එම්.ඊ.වී) පෙරමුණ ගත යුතු බවයි. ඒ අනුව පැෆ්රල් සහ සී.එම්.ඊ.වී යන මැතිවරණ නිරීක්ෂණ ආයතන යූ.එස්.ඒ.අයි.ඩී එස්ඩී.ගැප් යන ජාත්‍යන්තර ආයතනයේද සහාය සහිතව පළාත් සභා මැතිවරණ සංශෝධන පනත පිළිබඳ ඉතා පුළුල් නියෝජනයක් සහිත කරුණු විමසීමේ සාකච්ඡාවක් වසර 2018 අප්‍රේල් මස 25 වැනි දින පවත්වන ලදි.
තවද පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තෆා සහ මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් ද එක්ව පැවැත්වූ මූලික සාකච්ඡාවේදී ද මතු වූ මූලික කරුණක් නම් පැෆ්රල් සහ සී.එම්.ඊ.වී යන සංවිධාන දෙක, මිශ්‍ර සහික සමානුපාතික නියෝජන මැතිවරණ ක්‍රමය පිළිබඳ අදාළ පාර්ශව දැනුම්වත් කිරීම සඳහා පුළුල් ක්‍රියා මාර්ගයක් ගැනීම වඩාත් යෝග්‍ය බවයි.
තවද ඉහත සඳහන් කරන ලද කරුණු විමසීමේ සාකච්ඡාවේ දී තීරණය වූයේ විද්වතුන්, මැතිවරණ වෘත්තිකයන් හා නිරීක්ෂකයන්, මෙන්ම සිවිල් සමාජ සංවිධාන නියෝජිතයන් ගෙන් සැදුම්ලත් කමිටුවක් පත්කොට නිර්දේශ සහිත විස්තරාත්මක වාර්තාවක් නව මැතිවරණ ක්‍රමය පිළිබඳ අධ්‍යයනය කිරීමෙන් අනතුරුව නිකුත් කිරීම වඩාත් උචිත බවයි. ඒ අනුව පළාත් සභා මැතිවරණ ක්‍රමය පිළිබඳ සමාලෝචනය කිරීම සඳහා පත් කරන ලද මෙම කමිටුව, එකී කරුණු විමසීමේ සාකච්ඡාවේ ප්‍රතිඵලයක් බවසැළකිය යුතුය.
එමෙන්ම පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයා විසින් තවදුරත් දක්වන ලද්දේ මෙකී කමිටුව මගින් ලබා දීමටනියමිත නිර්දේශ දේශපාලන පක්ෂ නායකයන්ට සහ කැබිනට් අමාත්‍යවරුන් වෙත ලබාදීමට තමන් පියවර ගන්නා බවත් එකී නිර්දේශ අදාළ නීතිමය සංශෝධන සිදු කිරීමේදී ද සළකා බැලීමට ක්‍රියා කරන බවත්ය.

මෙම කමිටුවේ සාමාජිකයන් වූයේ :

1. මහාචාර්ය සුදන්ත ලියනගේ, පීඨාධිපති, ව්‍යවහාරික විද්‍යා පීඨය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
2. රෝහණ හෙට්ටිආරච්චි, විධායක අධ්‍යක්ෂ, පැෆ්රල් සංවිධානය
3. ආචාර්ය සුජාතා ගමගේ, ජ්‍යෙෂ්ඨ පර්යේෂිකා, ලර්න් ඒෂියා ආයතනය
4. නීතිඥ ලූවී ගනේෂදාසන්, පර්යේෂක, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
5. කුමුදුනී සැමුවෙල්, පර්යේෂිකා සහ සමාජ ක්‍රියාකාරිනී, කාන්තා සහ මාධ්‍ය සාමූහිකය
6. මංජුල ගජනායක, ජාතික සම්බන්ධීකාරක, මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය
7. එස්.මැදවැව,මැතිවරණ වෘත්තිකයන්ගේ සංගමයේ සභාපති හා හිටපු ජ්‍යෙෂ්ඨ පරිපාලන සේවා නිලධාරි
8. පී. එම්. සිරිවර්ධන, හිටපු අතිරේක කොමසාරිස්, මැතිවරණ දෙපාර්තමේන්තුව
9. අමර් ගුණතිලක, ප්‍රධාන විධායක නිලධාරී , මාර්ග ආයතනය,යන අයයි.

වසර 2017, අංක 17 දරන පළාත් සභා මැතිවරණ (සංශෝධන) පනත පිළිබඳ සමාලෝචනය කරමින් ඊට අදාළ කරුණු පුළුල්ව සාකච්ඡා කිරීමේ අරමුණින් මෙම කමිටුව, වසර 2018 මැයිමස 14, 21, සහ 30 යන දිනවලදී මෙන්ම ජුනි මස6,14, සහ 15 යන දිනයන්හි දී ද ජූලි මස 10, 18 සහ 23 යන දිනවල දී ද හමු වූ අතර එහිදී හඳුනාගත් ගැටළු සඳහා යෝජිත විසඳුම් ද සහිත පුළුල් යෝජනා මාලාවක් පිළිබඳ අවධානය යොමු විය.
පළාත් සභා සහ පළාත් පාලන මැතිවරණ ක්‍රමයට අදාළ වෙනස්කම් වලට අමතරව මෙරටේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම සඳහා ඉවහල් වන්නාවූ තවත් කේන්ද්‍රීය කරුණු කිහිපයක් ගැන කමිටුවේ අවධානය මෙහිලා යොමු විය. එලෙස හඳුනා ගත් අවශේෂ කරුණු වූයේ
අ). මැතිවරණ ප්‍රචාරක වියදම් සීමා කිරීම
ආ). දේශපාලන පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය
ඇ). අපේක්ෂකයන් තෝරා ගැනීම
ඈ). දේශපාලන පක්ෂ මාරුකිරීම වැළැක්වීම
යන ඒවාය.

තවද මෙම වාර්තාව මගින් එළිදැක්වීමට නියමිත නිර්දේශ ක්‍රියාවට නැගීම සඳහා සැළකිය යුතු කාල සීමාවක් ලබා ගත යුතු නොවන බව මෙන්ම එළඹෙන පළාත් සභා ඡන්ද විමසීම් පැවැත්වීම ප්‍රමාද කිරීම සඳහා වන හේතුවක් ලෙස ද මෙම වාර්තාව කිසිදු ලෙසකින් හෝ උපයෝගී කර නොගත යුතුය යන ස්ථාවරය කමිටු සාමාජිකයන් අඛණ්ඩවම දැරූ අතර එනිසාම කමිටු සාමාජිකයන් සළකා බලන ලද්දේ සති 8ත් - 12ත් අතර කෙටිකාල සීමාවක් තුළ සලකා බැලිය හැකි ප්‍රායෝගික කරුණු කිහිපයක් පිළිබඳව පමණි. යෝජිත සංශෝධන, නීතිමය ලේඛනයක් ලෙස සකස් කිරීමටත්, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා අනුකූලද යන්න පරීක්ෂා කිරීමට නීතිපති දෙපාර්තමේන්තුවටහා එය බලාත්මක කිරීම සඳහා පාර්ලිමේන්තුවට ද යොමුකළ යුතුව පවතින බැවින් එකී සමස්ත කාල සීමාව සඳහා ගත විය හැක්කේ තෙමසක පමණ කාලයක් පමණි. මීට අදාළව පාර්ලිමේන්තුව සම්මත කොට ඇති පූර්ව පනත වුව සංශෝධනයට ලක් කරන්නේ නම් මීට සමානම කාල සීමාවක් ගත වන බවද මෙහිලා සඳහන් කළ යුතුව ඇත.

එමෙන්ම සීමා නිර්ණය හා සබැඳි කිසිදු කිසිදු කරුණක් සළකා නොබැලීමට ද කමිටුව තීරණය කරන ලද අතර ඊට බලපාන ලද මූලිකම කරුණ වූයේ සීමා නිර්ණයේ දී අනුදත් ක්‍රියා මාර්ගය වී ඇත්තේ යම් පනතක් ක්‍රියාවට නැගීමට වඩා මැතිවරණ ක්‍රියාදාමයක් ක්‍රියාත්මක කිරීමයි.
ඒ අනුව කමිටුව එකඟ වූ මූලික කරුණක් වූයේ මේ වන විටත් පාර්ලිමේන්තුවේ 2/3 ක පමණ බහුතර බලයක් සහිතව සම්මත කර ඇති මෙම පනත සංශෝධන කිහිපයක් සහිතව භාවිතයට ගතයුතුය යන්නයි.

මෙහිලා දේශපාලන පක්ෂ, මැතිවරණ කොමිෂන් සභාව, ප්‍රධාන පෙළේ දේශපාලන පක්ෂ නායකයන්, පළාත් සභා මන්ත්‍රීවරුන්, සිවිල් සමාජ සංවිධාන, රජයේ විශ්වවිද්‍යාලයන්හී දේශපාලන විද්‍යා අධ්‍යයන අංශ, තරුණ හා මාධ්‍ය කණ්ඩායම් වැනි සියලු පාර්ශවකරුවන් එක් කරගත් පුළුල් සංවාදයක් දියත් කිරීම සඳහා සෑම කමිටු සාමාජිකයෙක් ම වග බලා ගත්හ.
වසර 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත පිළිබඳව ඒ ඒ දේශපාලන පක්ෂ දරන මතය ප්‍රකාශ කරන ලෙස දන්වා පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු දේශපාලන පක්ෂ වෙත ලිපි මගින් දැනුම්දීමට ද කමිටුව විසින් පියවර ගන්නා ලදි. එහිලා මෙම කමිටු වාර්තාව සකස් කොට අවසන් කිරීමට නියමිතව පැවති අවස්ථාව තෙක්ම දේශපාලන පක්ෂ වෙතින් ලද ප්‍රතිචාරය එතරම් සැළකිය යුතු මට්ටමක නොපැවති බවද කමිටුවේ නිරීක්ෂණයයි.

පහත සඳහන් පරිදි ප්‍රතිපත්තිමය කරුණු සාකච්ජා කිරීම සඳහා වූ කරුණු විමසීමේ සභා වාර කිහිපයක්ම පැවැත්විණ.

| | |
|---|---|
| ජුනි 06 | මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති, මහින්ද දේශප්‍රිය මහතා සමග පැවති සාකච්ජාව |
| ජුනි 18 (උදෑසන සාකච්ජාව) | කොළඹින් පිටත ප්‍රදේශ නියෝජනය කරනු ලබන පළාත් සභා මන්ත්‍රීවරුන්, කාන්තා සංවිධාන, සිවිල් සමාජ සංවිධාන හා සමගින් පැවතිසාකච්ජාව |
| ජුනි 18 (සවස් කාලයේ පැවති සැසිය) | බස්නාහිර පළාත නියෝජනය කරමින් පැමිණි පළාත් සභා මන්ත්‍රීවරුන්, කාන්තා සංවිධාන, සිවිල් සමාජ සංවිධාන, විද්වතුන් හා සමගින් පැවති සාකච්ජාව |
| ජුලි 04 | උතුරු නැගෙනහිර පළාත් නියෝජනය කරනු ලබන පළාත් සභා මන්ත්‍රීවරුන්, කාන්තා සංවිධාන, සිවිල් සමාජ සංවිධාන, විද්වතුන් හා සමගින් පැවති සාකච්ජාව |
| ජුලි 05 | පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තෆා මහතා සමග පැවතී සාකච්ජාව |
| ජුලි 10 | ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණෙහි සාමාජිකයන් හා පැවති සාකච්ජාව |
| ජුලි 12 | කඳුරට ජනතා පක්ෂයෙහි සාමාජික, පාර්ලිමේන්තු මන්ත්‍රී එම්. මයිල්වාන ගම් තිලක රාජා මහතා හා පැවති සාකච්ජාව, |
| ජුලි 18 | ඩලස් අලහප්පෙරුම, රන්ජිත් සොයිසා සහ ජානක වක්කුඹුර යන ඒකාබද්ධ විපක්ෂය නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරුන් සමගින් පැවති සාකච්ජාව. |
| ජුලි 26 | චම්පික රණවකමහතා, පාර්ලිමේන්තු මන්ත්‍රී සහ අමාත්‍ය මෙගා පොලිස් හා බස්නාහිර පළාත් - සමගින් පැවති සාකච්ජාව |

## උප ග්‍රන්ථය 2

## කමිටු නිර්දේශ සඳහා වන පදනම

### 1. දිස්ත්‍රික් ලැයිස්තුව සහ දිස්ත්‍රික් මන්ත්‍රීවරුන්

**2017 අංක 17 දරන පළාත් සභා මැතිවරණ (සංශෝධන) පනත** අනුව පළාත් සභාවල ආසනවලින් සියයට පනහක් කේවල කොට්ඨාශ ක්‍රමය මත මන්ත්‍රීවරු සඳහා ආසන වෙන්කරනු ලබන අතර, දිස්ත්‍රික් මට්ටමින් පත්වීමට නියමිත මන්ත්‍රීවරුන්[6] සඳහා සියයට පනහක් වෙන්කරනු ඇත.මෑතකදී පවත්වන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීම තුළලද අත්දැකීම් මත පදනම්ව, දිස්ත්‍රික් මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගන්නා ක්‍රමය පළිබඳව සැළකිලිමත් විය යුතු කරුණු කිහිපයක් තිබේ. ඉන් සමහරක් පහත දැක්වේ.

(අ) නම් කරනු ලබන අපේක්ෂකයන් අතුරින් දිස්ත්‍රික් මන්ත්‍රීවරුන් ලෙස කවරෙක් පත් කරන්නේ ද යන්න පිළිබඳව සීමාරහිත බලයක් දේශපාලන පක්ෂ ලේකම්වරුන් සතුය[7]. මින් අදහස් වනුයේ දිස්ත්‍රික් මට්ටමින් පත්වන මන්ත්‍රීවරුන් සඳහා 50% ක පමණ ආසන ප්‍රමාණයක් වෙන්කර ඇති බවත්, එලෙස වෙන්කර ඇති ආසන සඳහා තෝරාපත්කරගැනීමට නියමිත දිස්ත්‍රික් මන්ත්‍රීවරුන් අතරින් කවර තැනැත්තෙක් පත්කර ගනීවිද යන්න පිළිබඳව ඡන්දදායකයන් හට කිසිදු හිමිකමක් නොමැති බවයි.

(ආ) දිස්ත්‍රික් ලැයිස්තුව සඳහා නම්කර ඇති අපේක්ෂකයන්, තම මැතිවණ ප්‍රචාරණ ව්‍යාපාරය සඳහා කවර අන්දමේ දායකත්වයක් ලබාදේද යන්න මැන බැලීම සඳහා නිසි ක්‍රමවේදයක් දක්නට නොමැත.
(ඇ) තවද, ඉතා සුළු ඡන්ද පරතරයකින් කේවල ආසන ක්‍රමය යටතේ තරගකොට ,තම අසුන් අහිමි වන්නන් කළකිරීමට ද පත්විය හැකිය.වඩාත් දුෂ්කර හෝ ආන්තික අසුන් සඳහා තරග කිරීම වෙනුවට දිස්ත්‍රික් ලැයිස්තුව සඳහා තේරීපත්වීමට යම් දිරිගැන්වීමක් ද අදාළ ක්‍රමවේදය මගින් නිර්මාණය කර ඇත.

(ඇ) ජයග්‍රාහී දේශපාලන පක්ෂය මගින් දිස්ත්‍රික් මන්ත්‍රීවරුන් ලෙස තේරී පත්වීමට අපේක්ෂාවෙන් සිටින සංඛ්‍යාත්මක ව සුළු ඡන්ද ප්‍රමාණයක් ලබාගන්නා පක්ෂවල කාන්තාවන් හෝ වඩාත් කැපී පෙනෙන සාමාජිකයන් සඳහා දිස්ත්‍රික් ලැයිස්තුව තුළ කිසිදු අවස්ථාවක් හිමි නොවීමට ඉඩ ඇත.
**විසඳුමට අදාළ කරුණු කොටස් දෙකකින් සමන්විත වේ.**

පළමුව, තෝරා පත්කර ගැනීමට (සමානුපාතික ක්‍රමය යටතේ) නියමිත මන්ත්‍රීවරුන් නම් කිරීම සඳහා ප්‍රමුඛතාගත (ශ්‍රේණි ගත) සහ සංවෘත ලැයිස්තු භාවිත කරනු ඇත.

මෙම ක්‍රමය මඟින් ඡන්දදායකයන් තම ඡන්දය භාවිත කිරීමට පෙර තේරී පත්වීමට නියමිත පුද්ගලයා පිළිබඳ දැනුවත්වීමක් සිදුවනු ඇත.

දෙවනුව, ආසන ක්‍රමය මත ජයග්‍රහණය නොකළ අපේක්ෂකයන් දිරිගැන්වීම සඳහා, පරාජිත ආසන මන්ත්‍රීවරුන්ගෙන් 1/3 ක ප්‍රමාණයක් දිස්ත්‍රික් ලැයිස්තුව සඳහා නම් කිරීමට දේශපාලන පක්ෂ සඳහා අවස්ථාව ලබා දේ.

මෙහි නිර්ණායකය වනුයේ තරග කිරීම සඳහා ඉදිරිපත් වූ නමුත් ආසන මට්ටමින් පරාජයට පත්වූ මෙන්ම සභාව සඳහා අත්‍යාවශ්‍ය පුද්ගලයෙකු වශයෙන් පක්ෂය තීරණය කරනු ලබන තැනැත්තෙකු පත්කිරීම සඳහා යම් නම්‍යශීලී ප්‍රතිපත්තියක් හඳුන්වා දීමයි.
ඉතිරි වූ දිස්ත්‍රික් මන්ත්‍රීවරුන් ශ්‍රේණිගත සංවෘත ලැයිස්තුවේ අනුපිළිවෙලට පත්කිරීමට දේශපාලන පක්ෂවලට හැකියාව ලැබේ.(කාන්තා නියෝජනය පිළිබඳව 4 වැනි කොටස පරිශීලනය කරන්න)

### 2. එල්ලන ආසන (OVERHANG)

යම් පක්ෂයක් සමානුපාතික ක්‍රමය යටතේ ලබාගත් ඡන්ද ප්‍රමාණය මත ලැබිය යුතු ආසන සංඛ්‍යාවට වඩා කේවල ක්‍රමය යටතේ ආසන වැඩි ප්‍රමාණයක් දිනාගැනීමේ ප්‍රතිඵලය වනුයේ එල්ලන ආසන බිහිවීමයි. නිදසුනක් ලෙස ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව සඳහා 2018 පැවැති පළාත් පාලන ඡන්ද විමසීමේ දී ශ්‍රී ලංකා පොදුජන පක්ෂය ඡන්ද 41.4%ක් ලැබීම තුළ මන්ත්‍රී ධුර 32න් 15ක් ලැබිය යුතු විය. කෙසේ වෙතත් ඔවුන් කේවල කොට්ටාශ ක්‍රමය යටතේ මුළු ආසන 21න් ආසන 18ක්

---

[6] 2017 අංක 17 දරන පළාත් සභා මැතිවරණ (සංශෝධන) පනත අනුව මෙය "ආසන" ලෙස දක්වා ඇත
[7] පළාත් සභා මැතිවරණ පනත 58 A (4)(B) සහ 58 A (6) වගන්තිය බලන්න

දිනාගත් අතර එය එල්ලන ආසන තුනක් ලබාගැනීම සඳහා හේතු විය. මෙලෙස එල්ලන ආසන අන්තර්ගත කිරීම තුළ සිදු වූයේ සභාවේ මන්ත්‍රී ධුර සංඛ්‍යාව 38 දක්වා ඉහළ යාමයි.

සෑම පළාත් සභාවකම සමස්ථ මන්ත්‍රී ධුර සංඛ්‍යාව එලෙසම පවත්වා ගෙන යන අතරතුර එල්ලන ආසන සඳහා ද එහිලා අවස්ථාව සළසාදිය හැකිය. මෙහිදී දේශපාලන පක්ෂවලට එල්ලන ආසන වලට හිමිකම් කීමේ අවස්ථාව සැළසේ. නමුත් එකී එල්ලනු ලබන ආසන සමස්ථ ආසන සංඛ්‍යාවෙන් බෙදනු ලබන අතර එහිලා යම් ශේෂ වූ ආසන ප්‍රමාණයක් පවතී නම් ඒවා සියලු දේශපාලන පක්ෂ අතර සමානුපාතිකව බෙදා හැරේ. ඇත්ත වශයෙන්ම, මැතිවරණ ප්‍රතිඵල පාදක කරගනිමින් පළාත්සභාවන්හි සමස්ථ ආසන සංඛ්‍යාව වැඩි කිරීමේ හැකියාවක් මැතිවරණ කොමිෂන් සභාව සතුව නොමැති බැවින් මෙම ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමට සිදුවනු ඇත.

ශ්‍රී ලංකාව තුළ,අප සාමාන්‍යයෙන් දේශපාලන පක්ෂ අතර සමානුපාතික නියෝජනයට අදාළ ආසන ලබාදීම ගණනය සිදුකරනු ලබන සරළම ක්‍රමවේදය වන්නේ "විශාලම ඉතිරිය" මත බෙදා දක්වන ක්‍රමයයි. වෙනත් රටවල මේ සඳහා ප්‍රධාන ක්‍රම දෙකක් භාවිතා කරනු ලබයි. එනම් ඩී.ඔන්ඩෙට් (D´Hondt) ක්‍රමය හා සෙන්ට්-ලාගු (Sainte - Lague) ක්‍රමයයි. සමානුපාතිකමය ලෙස බෙදාහැරිය යුතු සමස්ථ ආසන ප්‍රමාණය අවම වීම තුළ යම් අවාසි සහගත තත්ත්වයක් උදාවන සංඛ්‍යාත්මක සුළු දේශපාලන පක්ෂ වලට සේන්ට් - ලාගු ක්‍රමයේ දී වඩාත් සාධාරණ ප්‍රථිඵලයක් ලබාදිය හැකිය.
ඩී.ඔන්ඩෙට් ක්‍රමය මඟින් විශාල දේශපාලන පක්ෂ සඳහා සුළු ප්‍රමාණයේ වාසිදායක තත්ත්වයක් උදාකරයි. මෙකී ක්‍රමයන්හි බලපෑම රටින් රටට වෙනස් වන අතර, ඒ ඒ රටෙහි අතීත දේශපාලන ක්‍රියාකාරීත්වය සැළකිල්ලට ගනිමින් වඩාත් සුදුසු වන්නේ කවර ක්‍රමවේදයක් ද යන්න තීරණය කළ යුතුය. ශ්‍රී ලංකාවට යෝග්‍ය වන්නේ කවර ක්‍රමවේදයක් ද යන්න සළකා බැලීමෙහි ලා අදාළ බලධාරීන් වෙත සහාය වන්නට ලැබීම පිළිබඳ මෙම කමිටුව තම සතුට පළකරනු ලබයි.

ඩී-ඔන්ඩෙට් සහ සැන්ටේ-ලාගු යන ක්‍රමවලදී, වරකට එකක බැගින් අනුක්‍රමික පියවර යටතේ ආසන වෙන් කිරීම සිදු කරනු ලබයි. සෑම පියවරකදීම ඒ ඒ පක්ෂ ලබා ඇතිමුළු ඡන්ද සංඛ්‍යාව ආසන ප්‍රමාණයෙන් බෙදනු ලබන අතර ඒ අනුව දැනටමත් ඒ සියලු දෙනා හට එක් අසුනක් එකතු වී ඇත.මෙහිදී වැඩිම ශේෂයක් අත්කර ගෙන ඇති පක්ෂය අසුනකට හිමිකම් කියයි. පළමු පියවරේ දී කිසිදු දේශපාලන පක්ෂයකට ආසනයකට හිමිකම් නොකියයි. ඒ අනුව භාජකය (බෙදීමට ලක්කිරීම) වන්නේ එකය. එමෙන්ම වැඩිම ඡන්ද ප්‍රමාණයක් සහිත දේශපාලන පක්ෂය A දේශපාලන පක්ෂය පළමු අසුනට හිමිකම් කියයි. දෙවන පියවරේදී A දේශපාලන පක්ෂයේ ශේෂය එහි මුළු ඡන්ද සංක්‍යාව බෙදීම දෙක වේ. හේතුව එය සතුව එක් අසුනක් තිබීමයි. අනිකුත් දේශපාලන සතු ශේෂය එලෙසම පවතින අතර වැඩිම ශේෂයක් සහිත දේශපාලන පක්ෂය දෙවන පියවරේදී , දෙවන අසුන ලබයි. ආසන වෙන්කොට අවසන් වන තෙක් මෙම ක්‍රියාවලිය නැවත නැවත සිදුවේ. කරුණු පැහැදිලි කරගැනීම සඳහා පිවිසෙන්න (https://www.youtube.com/watch?v=6CU3F3ToIlg)
සැන්ටේ-ලාගු ක්‍රමය තුල ආසන ප්‍රමාණයට එකක් එකතු කිරීමෙන් ලැබෙන සංඛ්‍යාවෙන් ,දෙවරක් මුළු ඡන්ද ප්‍රමාණය බෙදීමට ලක්කරනු ලබයි.

වසර 2018 මැතිවරණ ප්‍රථිඵල වලට අනුව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභාව සඳහා සමානුපාතික නියෝජන ක්‍රමයට අදාළ අසුන් වෙන්කිරීම පිළිබඳ සංසන්දනාත්මක සටහනක් පහත දැක්වේ.

## 3 වන වගුව

| පක්ෂය | ඡන්ද | ඡන්ද ප්‍රතිශතය | ඩී-ඔන්ඩෙට් ක්‍රමය | වර්තමාන ක්‍රමය | සැන්ටේ-ලාග් ක්‍රමය |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ | 22,068 | 41.4% | 17 | 16 | 16 |
| එක්සත් ජාතික පක්ෂය | 17,990 | 33.8% | 11 | 11 | 11 |
| එක්සත් ජනතා නිදහස් සන්ධානය | 7,676 | 14.4% | 4 | 5 | 5 |
| ජනතා විමුක්ති පෙරමුණ | 4.885 | 9.2% | 3 | 3 | 3 |
| එක්සත් ජනතා නිදහස් පෙරමුණ | 522 | 1.0% | - | - | - |
| ස්වාධීන කණ්ඩායම | 113 | 0.0% | - | - | - |
| අපේ ජාතික පෙරමුණ | 35 | 0.0% | - | - | - |
| **මුළු එකතුව** | **53,289** | **100%** | **35** | **35** | **35** |

**3. ස්ථාවරභාවය**

2018 පළාත් පාලන මැතිවරණයේදී පළාත් පාලන ආයතනයන්හි විශාල බෙදීමක් අපි දුටුවෙමු. පක්ෂ විශාල සංඛ්‍යාවකට හැකිවූයේ ආසන සුළු ප්‍රමාණයක් පමණක් දිනා ගැනීමටය. මෙය ප්‍රධාන හේතු දෙකක් නිසා සිදුවිය.

- පළාත් පාලන ආයතනයන්හි සභික ප්‍රමාණය වැඩිවිය. (ආසන්න වශයෙන් දෙගුණ විය) මෙම වැඩිවීම මැතිවරණ ක්‍රමය නිසා නොව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් ගත් තීරණය නිසා සිදුවූවකි.
- පළාත් පාලන ආයතන මැතිවරණ (සංශෝධන) පනතේ කඩඉම් (Cut - off Point) ප්‍රතිශතයක් ලකුණු කර නොතිබුණි. මෙමගින් ඉතා කුඩා දේශපාලන පක්ෂ මන්ත්‍රී ධූර දිනාගැනීමට සමත් වූ අතර එය පළාත් පාලන ආයතන අස්ථාවර කිරීමට හේතු විය.

මැතිවරණ ක්‍රමය තුළ දේශපාලන විවිධත්වය නියෝජනය වන මැතිවරණ ක්‍රමයක් නිර්මාණය කිරීම මෙන්ම තේරීපත් වූ ආයතනයන්හි පාලන බලය සහ ස්ථාවරත්වය ද වැදගත් කාරණා වේ. මෙම සළකා බැලීම එක්වර ලබාගත නොහැකි අතර ක්‍රම ක්‍රමයෙන් එකිනෙක ළඟා කරගත යුතුය.
පුළුල් උපදේශන මත පදනම් වී, කමිටුව විසින් පහත යෝජනා, සම්මුතීන් වශයෙන් ඉදිරිපත් කරනු ලැබේ.

- පළාත් සභාවක ජයග්‍රාහී පක්ෂයකට 2 සිට 4/5 දක්වා ප්‍රසාද (බෝනස්) ආසන සංඛ්‍යා වැඩි කිරීම. එමෙන්ම පළාතේ වැඩිම මනාප ලබාගත් පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට ප්‍රසාද ආසන ලබාදිය යුතුය. දිස්ත්‍රික් මට්ටමින් ප්‍රසාද ආසන ලබාදීම, එනම් පළාත තුල වෙනස් දිස්ත්‍රික්කයන්හි ජයග්‍රහණය කරන ලද පක්ෂ සඳහා බෝනස් ආසන ලබාදීම සිදුකළ හැකිය.

- මෙම විසඳුම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ආ ව්‍යවස්ථා ප්‍රකාරව ජනාධිපතිවරයා ප්‍රකාශයක් සිදුකිරීම අවශ්‍ය වන අතර පළාත් සභා පනතේ 2වන වගන්තිය සංශෝධනය කරමින් බස්නාහිර පළාත හැර අනෙකුත් පළාත් සභාවල අමතරව මන්ත්‍රීවරුන් දෙදෙනෙකු අනෙකුත් පළාත් සභා වලට යෙදවීමත් බස්නාහිර පළාත් සභාව සඳහා අමතර මන්ත්‍රීවරු තිදෙනෙක් පත්කිරීමත් සිදුකළ හැකිය.

- එමෙන්ම ලබාදෙනු ලබන ප්‍රසාද ආසන සංඛ්‍යාව වැඩි කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61 A (2)වගන්තිය සංශෝධනය කළ යුතුය[8]

**4. කාන්තා නියෝජනය**

කමිටුව විසින් අවධානය යොමුකළ යුතු යැයි හැඟෙන ප්‍රධාන කරුණු දෙකක් සහ සාකච්ඡා කළ යුතු බව හැඟෙන්නා වූ විවේචනාත්මක කරුණු දෙකක් පිලිබඳ අවධානය යොමුකරන ලදී. ඉන් එක් කරුණක් ලෙස, කාන්තාවන් සඳහා 25%ක් වූ කෝටාව සහ ඇතැම් පළාත් පාලන ආයතනයන්හි එම කෝටාව සහතික කිරීමේදී මැතිවරණ කොමිෂන් සභාව මුහුණ දෙන ලද දුෂ්කරතා වේ.
අනෙක් අතට කාන්තාවන්ට නාමයෝජනා ලබාදුන් ආකාරය හා ආසන වෙන් කරන ලද ආකාරය බොහෝවිට අසංවිධානාත්මක විය. ඉහත දක්වන ලද කරුණු දෙක ම නව පළාත් සභා මැතිවරණ සන්දර්භය ඉදිරියේ පවත්නා අභියෝගයන් වේ.
මෙම ගැටළු විසඳා ගත හැකි විකල්ප ප්‍රවේශයන් හඳුනාගැනීම සඳහා කමිටුවේ දැඩි අවධානයට යොමු විය.මේ අනුව කමිටුව පහත දැක්වෙන උපායමාර්ග යෝජනා කරනු ලැබේ.

- කේවල කොට්ඨාශ ක්‍රමයේ තුළ ආසන සඳහා කාන්තාවන්ට තරඟකිරීමට අවස්ථාව ලබාදීම හරහා එය 1/6 වෙනුවට 1/5ක් දක්වාවැඩි කිරීම මගින් කාන්තාවන්ට තරඟ කිරීමට වැඩි අවස්ථාවක් ලැබෙනු ඇත.
- අනුපිලිවෙලට සකසන ලද ශ්‍රේණිගත ලැයිස්තුවක් හඳුන්වාදීමත් එම ලැයිස්තුව කාන්තාවකගේ නමකින් ආරම්භ කිරීමත් සිදුවිය යුතුය.
- පාර්ලිමේන්තුව, පැරණි මැතිවරණ ක්‍රමය වෙත ආපසු යොමු වුනද කාන්තාවන් සඳහා 25%ක් වූ නාම යෝජනා සඳහා වන අනිවාර්ය ප්‍රතිපත්තියක් හඳුන්වාදීම අත්‍යාවශ්‍ය වේ.[9]

[8]පළාත් සභා පනතේ දෙවන වගන්තිය අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව පළාත් සභාවක් ස්ථාපිත කළ විට, ජනාධිපතිවරයා ගැසට් පත්‍රයේ පළකරන නිගමනය මගින් එම සභාව වෙත නමක් ලබාදිය යුතු අතර, එකී පළාත් සභාව පිහිටුවා ඇති පළාතේ ජනගහනය හා ජනඝණත්වය සැලකිල්ලට ගැනීමෙනි

[9]මෙම නිර්දේශය මගින් පළාත් සභාවන්හි වර්තමානයේ 4% ට අඩු ප්‍රතිශතයකින් යුත් අඩු කාන්තා නියෝජනය පිළිබඳ අවධානය යොමු කිරීමක් සිදු වේ.

5. සමානුපාතික ක්‍රමය යටතේ ඡන්ද ගණනය කිරීම පරිපාලන දිස්ත්‍රික්ක අනුව සිදු කිරීම.
එක් එක් පරිපාලන දිස්ත්‍රික්ක සඳහා සීමානිර්ණය යටතේ මැතිවරණ කොට්ඨාශයෙන් හා දිස්ත්‍රික්ක වලින් තෝරා පත්කර ගනු ලබන සභික සංඛ්‍යාව පහත පරිදි වේ.

**4 වන වගුව**

| පළාත | පරිපාලන දිසත්‍රික්කය | මැතිවරණ කොට්ඨාශය යටතේ තේරීපත් වීමට නියමිත මන්ත්‍රීවරු | දිස්ත්‍රික් මට්ටමින් තේරීපත් වීමට නියමිත සභික සංඛ්‍යාව (සමානුපාතික ක්‍රමය යටතේ) | පරිපාලන දිස්ත්‍රික්ක අනුව තේරීපත්වීමට නියමිත මුළු සභික සංඛ්‍යාව[10] |
|---|---|---|---|---|
| බස්නාහිර | කොළඹ | 20 | 20 | 40 |
| | ගම්පහ | 20 | 20 | 40 |
| | කලූතර | 11 | 11 | 22 |
| | | | | |
| මධ්‍යම | මහනුවර | 15 | 14 | 29 |
| | මාතලේ | 06 | 05 | 11 |
| | නුවර එළිය | 08 | 08 | 16 |
| | | | | |
| දකුණ | ගාල්ල | 11 | 11 | 22 |
| | මාතර | 09 | 08 | 17 |
| | හම්බන්තොට | 07 | 07 | 14 |
| | | | | |
| උතුර | යාපනය | 08 | 08 | 16 |
| | කිලිනොච්චිය | 02 | 02 | 04 |
| | මන්නාරම | 03 | 02 | 05 |
| | වවුනියාව | 03 | 03 | 06 |
| | මුලතිව් | 03 | 02 | 05 |
| | | | | |
| නැගෙනහිර | මඩකලපුව | 06 | 05 | 11 |
| | අම්පාර | 07 | 07 | 14 |
| | ත්‍රිකුණාමලය | 05 | 05 | 10 |
| | | | | |
| වයඹ | කුරුණෑගල | 17 | 17 | 34 |
| | පුත්තලම | 08 | 08 | 16 |
| | | | | |
| උතුරු මැද | අනුරාධපුරය | 11 | 10 | 21 |
| | පොලොන්නරුව | 05 | 05 | 10 |
| | | | | |
| ඌව | බදුල්ල | 09 | 09 | 18 |
| | මොණරාගල | 07 | 07 | 14 |
| | | | | |
| සබරගමුව | රත්නපුර | 12 | 12 | 24 |
| | කෑගල්ල | 09 | 09 | 18 |

ඉහත වගුවේ දැක්වෙන පරිදි උතුරු පළාතෙහි පරිපාලන දිස්ත්‍රික්ක සඳහා තෝරාපත් කර ගත යුතු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව ඉතා අවම සංඛ්‍යාවක් බව පැහැදිලිව පෙනීයයි. මීට බලපෑ ඇති ප්‍රධාන හේතුව වන්නේ මෙකී ප්‍රදේශයන්හි දක්නට ලැබෙන අඩු ජනගහනය හා පරිපාලන දිස්ත්‍රික්කයේ විශාලත්වයයි. මෙහිලා වඩාත් වැදගත් වන්නේ සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ ලබාදිය යුතු මන්ත්‍රී ධූර ප්‍රමාණවත් පරිදි නොපවතින බැවින් උතුරු පළාත් සභා ඡන්ද විමසීමේ අවසන් ප්‍රතිඵලය ලබාදීමේ දී මෙය ඉතා ඉහළ අසමානුපාතිකත්වයක් නිර්මාණය වීම සඳහා හේතු විය හැකි වීමයි.

[10] පළාතේ වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් දේශපාලන පක්ෂයට ලබාදී ඇති දැනට පවතින බෝනස් ආසන 2 මෙයට ඇතුළත් නොවේ. (61 A වගන්තිය බලන්න)

මෙය සකස් කරගැනීමේ දී දිස්ත්‍රික් මට්ටමේ සමානුපාතික නියෝජනයක් ගණනය කිරීම (උදාහරණයක් ලෙස යාපනය හා කිලිනොච්චි දිස්ත්‍රික්කය වෙත එකතු කිරීම, සහ මන්නාරම, වවුනියා සහ මුලතිව් දිස්ත්‍රික්ක වන්නි මැතිවරණ දිස්ත්‍රික්කය ලෙස එකතු කිරීම)
මේ සඳහා නව සීමා නිර්ණයක් අවශ්‍ය නොවන අතර කේවල ක්‍රමය යටතේ සීමාවන් මේ සඳහා යොදාගත හැකිය.

අදාළ වෙනස්කම් සිදුකිරීමෙන් අනතුරුව උතුරු පළාත් සභාවේ ආසන සංයුතිය පහත පරිදි දැක්වේ.

**5 වන වගුව**

| **පළාත** | **මැතිවරණ දිස්ත්‍රික්කය** | **කොට්ඨාශයකින් තේරී පත්වන සභික සංඛයාව** | **දිස්ත්‍රික්මන්ත්‍රීවරු ලෙස තේරීපත් වන සභික සංඛ්යාව** | **පරිපාලන දිස්ත්‍රික්කය තුලින් තේරීපත් වන මුළු සභික සංඛ්‍යාව**[11] |
|---|---|---|---|---|
| උතුරුපළාත | යාපනය | 10 | 10 | 20 |
| | වන්නි | 9 | 7 | 16 |

[11]පළාතේ වැඩිම සංඛ්‍යාවක් ලබාගත් දේශපාලන පක්ෂයට දෙන ලද බෝනස් ආසන 2 ඇතුලත් නොවේ. (61 අ වගන්තිය)

## උප ග්‍රන්ථය 3

### නිරතුරුව අසනු ලබන ප්‍රශ්ණ

ප්‍රශ්නය අංක 01-

*1.නව මැතිවරණ ක්‍රමය සෑම අවස්ථාවකදීම විශාල සභාවන් වෙත කේන්ද්‍රගත වේ ද?*

නැත, නව ක්‍රමයේ ප්‍රතිඵලයක් ලෙස පළාත් සභාවන්හි සාමාජිකයන් සංඛ්‍යාව වැඩි නොවනු ඇත. මෙහිදී පළාත් සභා සඳහා සභිකයන් පත්කර ගන්නා ආකාරය පමණක් සංශෝධනය වන අතර සභිකයන්ගෙන් කොටසක් පමණක් කොට්ඨාශ මට්ටමින් හා ඉතිරි සභිකයන් පිරිස දිස්ත්‍රික්ක ලැයිස්තුවෙන් තෝරා පත්කරනු ඇත. පළාත් පාලන ආයතන සඳහා වුව ද, සභාවේ ප්‍රමාණය අඩු කිරීම සඳහා මෙම ක්‍රියාවලිය වැඩි දියුණු කළ යුතුය. පළාත් පාලන ආයතනයෙහි ප්‍රමාණය සීමා නිර්ණය ක්‍රියාවලිය හරහා නිර්මාණය කරන ලද කොට්ඨාශ මත හෝ කොට්ඨාශ සංඛ්‍යාව මත පදනම් වන අතර, මෙම ක්‍රමයේ භාවිත කරන ලද සරළ බහුතර ක්‍රමය මත වූ ආසන සහිත එල්ලන ආසන (Overhangs) මත යැපේ. පළාත් සභාවන්හි මුළු මන්ත්‍රී සංඛ්‍යාව අත්තනෝමතික ලෙස වැඩි කළ නොහැකිය. මුළු ආසන සංඛ්‍යාවෙන් එල්ලන ආසන අඩු කිරීම හා සමානුපාතික ක්‍රමය සඳහා වෙන් කරන ලද සංඛ්‍යාව නැවත ගණනය කිරීම තුළින් වැඩිවන එල්ලන ආසන සංඛ්‍යාව සඳහා පහසුකම් සළසාලිය හැකිය.

ප්‍රශ්නය අංක 02-

*වඩාත් ස්ථාවර සභාවක් ඇතිකළ හැකි වන පැරණි ක්‍රමය වෙත ආපසු යාම වඩාත් සුදුසු නොවන්නේද?*

නැත, පැරණි ක්‍රමය සහ නව පද්ධතිය පූර්ණ වශයෙන් සමානුපාතික පද්ධති දෙකකි. එම නිසා යම් පක්ෂයක් පැරණි ක්‍රමය යටතේ ලබාගන්නා ඡන්ද ප්‍රමාණය x ප්‍රමාණයක් වේද සහ නව ක්‍රමය යටතේ ඡන්ද x ප්‍රමාණයක් ලබාගත්ත ද ඔවුන් හට ලැබෙන ආසන සංඛ්‍යාව සමාන වනු ඇත. ඒ ඒ පක්ෂ ලබාගන්නා ඡන්ද ප්‍රතිශතය මත ආසන සංඛයාව බෙදී යනු ඇත.

මෙම මැතිවරණ ක්‍රම දෙක අතර පවත්නා එකම වෙනස වනුයේ එක් එක් ආසන පිරවීම සඳහා මන්ත්‍රීවරු තෝරාගන්නා ආකාරයයි. පැරණි ක්‍රමය යටතේ ඔවුන් ලබාගන්නා මනාප සංඛ්‍යාව අනුව සාමාජිකයන් තෝරා පත්කරනු ලැබේ. නව පද්ධතිය අනුව එය සරළ බහුතර ක්‍රමය (කේවල ක්‍රමය) යටතේ ජයගන්නා ලද මන්ත්‍රීවරුන්ගෙන් සහ දිස්ත්‍රික් ලැයිස්තුවෙන් තෝරාගනු ලබන මන්ත්‍රීවරුන්ගේ සංකලනයක් වනු ඇත.

ප්‍රශ්නය අංක 03-

*මහ ඇමති තෝරා පත්කර ගැනීම සඳහා පක්ෂ විසින් කේවල ක්‍රමය යටතේ ආසන බහුතරයක් දිනා ගැනීම අවශ්‍ය නොවේද?*

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට[12] අනුව පළාත් සභාවලට තේරී පත්වූ මුළු සාමාජිකයන්ගෙන් දෙකෙන් එකකට වැඩි ප්‍රමාණයක් එක් දේශපාලන පක්ෂයක සාමාජිකත්වය දරන අතර ආණ්ඩුකාරවරයා විසින් එම පක්ෂයේ නායකයා ප්‍රධාන අමාත්‍යවරයා ලෙස පත්කරනු ඇත .

එක් දේශපාලන පක්ෂයකට පළාත් සභාවලට තේරී පත්වූ මුළු සාමාජිකයන්ගෙන් භාගයකට වඩා නොවැඩි අවස්ථාවලදී, ස්ථාපිත පළාත් සභාවේ යම්කිසි මන්ත්‍රීවරයෙකු ඒ පළාත් සභාවේ යම්කිසි මන්ත්‍රීවරයෙකුගේ සහය ලබාගැනීමට සමත් වන්නේ යැයි ආණ්ඩුකාරවරයාගේ මතය වන තැනැත්තා ප්‍රධාන අමාත්‍ය ධූරය සඳහා පත්කළ යුතුය.

මෙම තත්ත්වයන් දෙකෙහිදී ම වැදගත් වනුයේ පළාත් සභාවට තේරී පත්වී ඇති මුළු සාමාජිකයන් වන අතර කේවල ආසන සංඛ්‍යාව නොවේ. පළාත් සභාවේ 50% ක ප්‍රතිශතයක් පමණක් කේවල ආසන ක්‍රමයකට අයිති වේ.

---

[12] 1546 ඊ (4) ව්‍යවස්ථාව, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

ප්‍රශ්නය අංක 04-

*කොට්ඨාශ ක්‍රමය යටතේ ආසන අඩුවෙන් ලබාගනු ලබන පක්ෂ බෝනස් ආසන ලබාගන්නේ ඇයි?*

මෙම අදහස පදනම් වන්නේ නව මැතිවරණ ක්‍රමය ක්‍රියාත්මක වන්නේ කෙසේ ද යන්න පිලිබඳ වැරදි අදහස මතය. දිස්ත්‍රික් ලැයිස්තු මන්ත්‍රීවරු යනු ප්‍රසාද ආසන මන්ත්‍රීවරු නොවේ. එය ඔවුන් ලබාගත් ඡන්ද පදනම මත ඔවුන්ගේ "සාධාරණ පංගු" ඉහළ දැමීම සඳහා දෙනු ලබන ඉහළ දැමීමක් වේ. මිශ්‍ර සමානුපාතික ක්‍රමය ක්‍රියාත්මක වන ආකාරය පහත පරිදි සරල කර දැක්විය හැකිය.

උදාහරණයක් ලෙස "Y" නමැති දිස්ත්‍රික්කයට කේවල ක්‍රමය යටතේ ආසන 10ක් හා සමානුපාතික ආසන 10ක් ඇති අතර මුලු ආසන සංඛ්‍යාව 20ක් ලෙස සළකමු. මැතිවරණයේ දී 100,000 ක් පුද්ගලයන් A,B හා C පක්ෂ සඳහා ඡන්ද පහත පරිදි භාවිතා කළහොත්,

A පක්ෂය - ඡන්ද 50,000 ක් සහ ආසන 7ක් දිනා ඇත.

B පක්ෂය - ඡන්ද 30,000ක් සහ ආසන 3ක් දිනා ඇත.

C පක්ෂය - ඡන්ද 20,000ක් සහ ආසන දිනා නොමැත.

මුළු ඡන්ද සංඛ්‍යාව - 100,000

ඉහත ඡන්ද ප්‍රමාණය මිශ්‍ර සහිත සමානුපාතික ක්‍රමය යටතේ පහත පරිදි වේ.

**6 වන වගුව**

| | | A | B | C | D |
|---|---|---|---|---|---|
| **දේශපාලන පක්ෂය** | **මුළු ඡන්ද ප්‍රමාණය** | **ඡන්ද ප්‍රමාණය** | **කේවල ආසන** | **මුළු ආසන සංඛ්‍යාව (මුළු ආසන සංඛ්‍යාවx A තීරුව)** | **සමානුපාතික ලැයිස්තුව හානිපූර්ණ(C තීරුව හා B තීරුව)** |
| A | 50,000 | 50% | 7 | 10 | 3 |
| B | 30,000 | 30% | 3 | 6 | 3 |
| C | 20,000 | 20% | 0 | 4 | 4 |
| මුළු සංඛ්‍යාව | 100,000 | 100% | 10 | 20 | 10 |

ප්‍රශ්නය අංක 05-

*එකම ඡන්ද කොට්ඨාශය සඳහා බහුවිධ නියෝජනයක් ලබාගන්නේ මන්ද?*

එම කොට්ඨාශයේ ඡන්දදායකයෙකු වීමට නුසුදුසු නොවන්නා වූ ඕනෑම අයෙකු පළාත් සභා මැතිවරණය සඳහා අපේක්ෂකයෙකු වීමට සුදුසුකම් ලබයි. දිස්ත්‍රික් ලැයිස්තුවේ යම් ප්‍රදේශයක වෙසෙන පදිංචිකරුවන් ද විය හැකිය. එබැවින් මැතිවරණ කොට්ඨාශ අපේක්ෂකයන් සහ දිස්ත්‍රික් ලැයිස්තු අපේක්ෂකයන් එකම ආසනයක සිටින අවස්ථා ද තිබිය හැකිය. මෙවැනි තත්ත්වයන් මතු වීම නොවැළැක්විය හැකිය.